# ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ආහාර රටාව: ගස් ගොළුබෙල්ලන් (*Acavus* sp:) පරිභෝජනය පිළිබඳ අත්හදාබැලීමේ පුරාවිද්‍යා අධ්‍යයනයක්

කසුන් රුහිරු මධුසංක[2]

---

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ස්ථාන කැණීම් මගින් හමුවන පුරාවිද්‍යා සාධක අතර අකාවුස් (*Acavus* Sp:) වර්ගයේ ගස් ගොළුබෙල්ලන්ගේ කවච විශාල වශයෙන් හමු වේ. මේවා පුරා පාරිසරික කෘති, පුරාකෘතියක් ලෙස මෙන් ම මනස් කෘතියක් ලෙස ද හඳුනාගත හැකි ය.  මේ පිළිබඳ ව පල වී ඇති පූර්ව පර්යේෂකයන්ගේ අදහස් විවරණය කිරීමත්, ගස් ගොළුබෙල්ලන් ආහාරයට ගතහැකි ද, ආහාරයට ගත් ක්‍රමවේදය කුමක් ද සහ කවචයේ සාදා ඇති සිදුරෙහි උපයෝගීතාව කුමක් ද යන පර්යේෂණ ගැටළු මුල් කර ගෙන මෙම අධ්‍යයනය සිදු කරන ලදී. බෙලි කටු අවශේෂ ද්‍රව්‍යයමය වුව ද එහි අතීත පැතිකඩ විවර වන්නේ පුරාවිද්‍යාව, පුරා මෘද්වංශවිද්‍යාව ආදී විෂයන් තුළින් බැවින් එය සාකච්ඡාවට බඳුන් කළ හැක්කේත් එකී ප්‍රවේශයන් තුළින් ම ය. එබැවින් පුස්තකාල අධ්‍යයනයෙන් හා අන්තර්ජාලය භාවිතයෙන් මෙන් ම පූර්ව පර්යේෂකයන් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව පර්යේෂණාත්මක පුරාවිද්‍යා ප්‍රවේශයක් ගනිමින් මෘද්වංශවිද්‍යාව තුළ පැමිණෙන සංකල්ප ද පෙර දැරිව ක්ෂේත්‍රය තුළ ප්‍රායෝගිකව අත්හදා බලන ලදී. මෙහි දී දොරවක ලෙන ප්‍රදේශයෙන් 2016.02.11 දින මීටර් 10x10 ප්‍රදේශයක  විනාඩි 20 ක් තුළ එකතු කරගත් අකාවුස් සුපර්බස් (*Acavus subperbus*)  හා අකාවුස් පීනික්ස් (*Acavus phoenix*) යන විශේෂයන් හි බෙල්ලන් සය දෙනෙකු යොදා ගනිමින් ගින්නට යොමුකිරීම, අඟුරු මත පිළිස්සීම හා බෙලි කවචය සිදුරුකොට කෝටුවක ආධාරයෙන් ගින්නට යොමුකිරීම ආදී ක්‍රම තුනක් යටතේ ඔවුන් විනාඩි දෙකක කාලයක් ගින්නෙන් පිළිස්සීම සිදුකළ අතර එහි දී සෑම බෙල්ලෙකුගේම කවච තුළින් යම් ස්‍රාවයයක් පිටවිය. කෝටුවක ආධාරයෙන් පිළිස්සූ බෙල්ලා හැර අනෙක්  සියලු බෙල්ලන්ගේ කවච 80% ක් පමණ විනාශ වී සුදු පැහැයට හැරී තිබුණ අතර ආහාරයට ගැනීමේ දී පිළිස්සූ ගොළුබෙලි මාංශ ස්වභාවයෙන් කුකුළකුගේ ගෙල කොටසේ මාංශයන්ට සමාන බව ද, පිළිස්සූ කජු මදවලට සමාන රසයකින් යුතු බව ද හඳුනා ගන්නා ලදී. කැණීම් මගින් හමුවන බෙලිකටු කවචවල දක්නට ඇති සිදුර බෙල්ලන් පුළුස්සා ගැනීම සඳහා භාවිත කරන ලද්දක් බව පූර්ව කැණීම් සාධක සමග සංසන්දනාත්මකව හඳුනාගැනිණි. එමෙන් ම මෙම බෙලි කටු ආභරණ ලෙස පළඳින්නට ද ඇති බව වර්තමානය සමග සංසංදනාත්මකව බැලීමෙන්  පැහැදිලි වේ. මෙමඟින් ගස්ගොළුබෙල්ලන් ආහාරයට ගත හැකි බව ද එක් අයෙකුට දවසක් සඳහා අවශ්‍යය ප්‍රෝටීන් ප්‍රමාණය ආසන්න ලෙස බෙල්ලන් 8 - 10 ප්‍රමාණයකින් සපිරෙන බැවින් එය අතුරු ආහාරයක් ලෙස හෝ  ආහාර දුළභ කාල වලදී අමතර මාංශමය ආහාරයක් ලෙස බලංගොඩ මානවයා ආහාරයට ගන්නට ඇති බව මෙම අත්හදාබැලීමේ අධ්‍යයනයෙන් තහවුරු කර ගන්නා ලදී.

ප්‍රමුඛ පදඃ මධ්‍යශිලා මානවයා, ගස් ගොළුබෙල්ලන්, අත්හදාබැලීමේ පුරාවිද්‍යාව, ආහාර රටාව.

---

[2]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, Kasun.ruhiru@gmail.com.